0184

OL/2014/12/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | | |
|---|---|---|
| **ශෛවනෙරි** | **I, II** | **පැය තුනයි** |
| சைவநெறி | **I, II** | மூன்று மணித்தியாலம் |
| Saivaneri | **I, II** | *Three hours* |

## ශෛවනෙරි I

**සැලකිය යුතුයි :**
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "වෙල්ලයි එරුදේරුම් විරිසඩයෝන් පෙට්රෙඩුත්ත පිල්ලයාර්" යන්න ඇතුළත් ග්‍රන්ථය,
   (1) විනායගර් අගවල් ය. (2) විනායග පුරාණම් ය.
   (3) පිල්ලයාර් කදයි ය. (4) ගනේශ පංජරත්තිනම් ය.

2. 'තිරුක්කෝවයාර්' රචනා කරනු ලැබුවේ,
   (1) තිරුමූලර් විසිනි. (2) අරුණගිරිනාදර් විසිනි.
   (3) මානික්කවාසගර් විසිනි. (4) තිරුනාවුක්කරසර් විසිනි.

3. ශෛව ධර්මයේ යෝග මාර්ගය පිළිපදින්නන් ලබන විමුක්තිය,
   (1) සාලෝගම් ය. (2) සාමීබම් ය. (3) සායුච්චියම් ය. (4) සාරූබම් ය.

4. දෙවියන් දේව මැණියන් සමඟ විවාහ වූ දවස ලෙස සලකනු ලබන්නේ,
   (1) පංගුණි තිංගල් ය. (2) පංගුණි උත්තරම් ය.
   (3) මාර්ගලි තිරුවාදිරයි ය. (4) මාසි මගම් ය.

5. හින්දු හා සිංහල අලුත් අවුරුද්දේ සූර්යයා පිවිසෙන්නේ,
   (1) සිංහ ලග්නයට ය. (2) මකර ලග්නයට ය. (3) වෘෂභ ලග්නයට ය. (4) මේෂ ලග්නයට ය.

6. උපවාසවල විශිෂ්ටත්වය කියාපාන ශ්‍රී ලංකාවේ බිහි වූ කෘතිය,
   (1) සිවරාත්‍රි පුරාණම් වේ. (2) කන්දපුරාණම් වේ.
   (3) තිරුවිලයාඩට් පුරාණම් වේ. (4) තිරුකරසයි පුරාණම් වේ.

7. නම්බියාණ්ඩාර් නම්බි රචනා කළ ග්‍රන්ථය වන්නේ,
   (1) තිරුතොණ්ඩත්තොගයි ය. (2) තිරුතොණ්ඩර් තිරුවන්දාදි ය.
   (3) කෝයිල් නාන්මණිමාලෛ ය. (4) තිරුමුරුගාටෘපඩයි ය.

8. වන්දනා කිරීමෙන් විමුක්තිය ලබා ගත හැකි දේවාලය,
   (1) තිරුවාරූර් ය. (2) කාසි ය. (3) සිදම්බරම් ය. (4) තිරුවණ්ණාමලයි ය.

9. මෙයිකණ්ඩදේවර් ජීවත් වූයේ,
   (1) ක්‍රි. ව. 10 වන සියවසේ දී ය. (2) ක්‍රි. ව. 11 වන සියවසේ දී ය.
   (3) ක්‍රි. ව. 12 වන සියවසේ දී ය. (4) ක්‍රි. ව. 13 වන සියවසේ දී ය.

10. "පට්ට කට්ටයිල් පගට්කුරුඩු පෝගින්රදු" යනුවෙන් සඳහන් කළේ,
   (1) උමාපති සිවාචාරියාර් ය. (2) මරෛඥාන සම්බන්දර් ය.
   (3) ගුරුඥාන සම්බන්දර් ය. (4) තිරුඥාන සම්බන්දර් ය.

11. "රාජකාරියෙන් ගිලිහුණොත් දෙවියන් බැහැ ඇකීමට නොහැකි ය" යනුවෙන් පැවසුවේ,
   (1) සිත්තානයිකුට්ටි සුවාමිහල් ය. (2) යෝගර් සුවාමිහල් ය.
   (3) මුත්තුලිංග සුවාමිහල් ය. (4) පෙරියානයිකුට්ටි සුවාමිහල් ය.

[දෙවන පිටුව බලන්න

12. කුමරගුරුබරර්ට කථන හැකියාව ලැබුණු දේවාලය
(1) තිරුප්පෙරුන්තුරයි ය. (2) තිරුත්තණිගයි ය. (3) තිරුවේරගම් ය. (4) තිරුච්චෙන්දූර් ය.

13. '19 වන සියවසේ ලංකාවේ ශෛව ආගම යළි බිහි කිරීමේ පියාණන්' යනුවෙන් හඳුන්වන්නේ,
(1) සී. වයි. තාමෝදරම් පිල්ලයි තුමා ය. (2) කාසිවාසි සෙන්දිල්නාදයියර් තුමා ය.
(3) ශෛවපෙරියාර් සු. සිවපාදසුන්දරනාර් තුමා ය. (4) ශ්‍රීලශ්‍රී ආරුමුගනාවලර් තුමා ය.

14. දෙවියන් පිළිබඳ සොරූහම් හා තඩත්තම් යන සංකල්ප සඳහන් කරන්නේ,
(1) වේදාත්තම් ය. (2) ශෛව සිද්ධාන්ත ය.
(3) විසිට්ටාත්වයිදම් ය. (4) වීරශෛවම් ය.

15. ශෛව සිද්ධාන්ත දැක්මේ මලම් තුන (මුම්මලම්) ම වැළඳුණු ආත්ම හඳුන්වන්නේ,
(1) සගලර් යනුවෙනි. (2) පිරලයාගලර් යනුවෙනි.
(3) විඥ්ඥානගලර් යනුවෙනි. (4) සිවන්මුත්තර්ලා යනුවෙනි.

16. අප මුලින් දුටු දෙවියන් වන්නේ,
(1) එකට උපන් අය සහ නෑදෑයන් ය. (2) මව සහ පියා ය.
(3) මිතුරන් සහ අසල්වැසියන් ය. (4) අමුත්තන් සහ ගුරුවරයා ය.

17. ශිවලිංග පූජාව කිරීමට සුදුසුකම ලබා දෙන්නේ,
(1) විශේෂ තීට්චයි ය. (2) නිර්වාන තීට්චයි ය. (3) ආගමික තීට්චයි ය. (4) ආචාර්ය අභිෂේකය ය.

18. 'ශිව' යන නම සඳහන් කරන ලංකාවේ පැරණි ම සාක්ෂිය වන්නේ,
(1) බ්‍රාහ්මී අක්ෂර ය. (2) චෝලයන්ගේ සෙල්ලිපි ය.
(3) වෙළඳුන් භාවිත කළ අක්ෂර ය. (4) කෝට්ටේ යුගයේ සෙල්ලිපි ය.

19. මුහුදු ජලයෙන් පහන් පත්තු කර වන්දනා කරනු ලබන පත්තිනි දේවාලය වන්නේ,
(1) කාරයිතිවු කන්නගි අම්මන් දේවාලය ය. (2) වට්රාපලයි කන්නගි අම්මන් දේවාලය ය.
(3) පට්ටිනගර් කන්නගයි අම්මන් දේවාලය ය. (4) සුදුමලයි පුවනේෂ්වරි අම්මන් දේවාලය ය.

20. චෝල අධිරාජ්‍යවරුන්ගේ කාලයේ ශ්‍රී ලංකාවේ 'මච්චේෂ්වරම්' යනුවෙන් හැඳින් වූ දේවාලය,
(1) තිරුකේදීෂ්වරම් ය. (2) තාන්තෝන්රීෂ්වරම් ය.
(3) තිරුකෝණෙෂ්වරම් ය. (4) වානවන්මාදේවීෂ්වරම් ය.

21. සේරමාන් පෙරුමාල් නායනාර් තුමන් ගායනා කළ භක්ති ගීත ඇතුළත් වන්නේ,
(1) 5 වන තිරුමුරයිවලට ය. (2) 8 වන තිරුමුරයිවලට ය.
(3) 11 වන තිරුමුරයිවලට ය. (4) 12 වන තිරුමුරයිවලට ය.

22. විසිවන සියවසේ මඩකලපුවේ ආගමික හා සමාජීය සේවාවන් කළේ,
(1) සිත්තානයිකුට්ටි සුවාමිහල් ය. (2) මුත්තුලිංග සුවාමිහල් ය.
(3) සුවාමි විපුලානන්දර් ය. (4) කඩයිට් සුවාමිහල් ය.

23. කොළඹ පිහිටි පොන්නම්බලවානේෂ්වරර් දේවාලයට අයත් වෘක්ෂය වන්නේ,
(1) බෙලි ගස ය. (2) අඹ ගස ය. (3) දෙළුම් ගස ය. (4) කොස් ගස ය.

24. ජූලි අමාවක (ආඩි අමාවාසයි) තීර්ථ දින විශේෂත්වය දරන මඩකලපුවේ පිහිටි දේවාලය,
(1) තිරුක්කෝවිල් සිත්තිරවේලායුදර් දේවාලයයි. (2) සිත්තාණ්ඩි මුරුගන් දේවාලයයි.
(3) මාමාංග පිල්ලයාර් දේවාලයයි. (4) කළුදාවලයි පිල්ලයාර් දේවාලයයි.

25. ශිව දෙවියන්ගෙන් රන්කාසි (පඩිකාසු) ලබා ගත්තේ,
(1) සුන්දරර් සහ මානික්කවාසගර් ය. (2) සම්බන්දර් සහ අප්පර් ය.
(3) කාරයිකාල් අම්මයාර් සහ ඉසයිඥානියාර් ය. (4) පූසලාර් සහ තිරුමූලර් ය.

26. 'සිත්තාන්ද අට්ටගම්' රචනා කළ උමාපති සිවාචාරියාර්,
(1) අගසන්දාන කුරවර් කෙනෙකි. (2) පුරසන්දාන කුරවර් කෙනෙකි.
(3) 'බණ්ඩාරසාත්තිරම්' ද රචනා කළේ ය. (4) තිරුවාරුර්හි උපන්නෙකි.

27. 'තන්මාත්තිරයිහල්' යනුවෙන් හඳුන්වන්නේ,
(1) ශරීරය, කට, ඇස, නාසය සහ කන ය. (2) රස, ආලෝකය, ස්පර්ශය, ශබ්දය සහ සුවඳ ය.
(3) සිත, දැනුම, සිතුවිල්ල සහ අහංකාරය ය. (4) පොළොව, ජලය, ගින්දර, සුළඟ සහ ආකාශය ය.

[තුන්වන පිටුව බලන්න

28. ශිව දෙවියන් කෙරෙහි භක්තිය සහ ඔහුගේ වීර ක්‍රියා, ආශිර්වාද කිරීමේ හැකියාව, ආවේණික බව සහ උසස් බව යන ඒවා පිළිබිඹු කරන්නේ,
(1) වේද මගින් ය. (2) නලායිරත්දිව්‍ය ප්‍රබන්ධම් මගින් ය.
(3) පැරණි ඉතිහාස කතා මගින් ය. (4) අරිචන්ද්‍ර පුරාණම් මගින් ය.

29. දෙසැම්බර් (මාර්ගලි) මාසයේ තිරුපාවයි උපවාසය කරනු ලබන්නේ,
(1) පත්තිනි මෑණියන් වෙනුවෙනි. (2) මහාවිෂ්ණු දෙවියන් වෙනුවෙනි.
(3) මුරුග දෙවියන් වෙනුවෙනි. (4) ගණ දෙවියන් වෙනුවෙනි.

30. ලෝකයට ම පොදුවේ අදාළ වන ශෛව ප්‍රතිපත්තිය පැහැදිලි වන ප්‍රකාශය කුමක් ද?
(1) ඔරු පොල්ලාප්පුම් ඉල්ලයි (2) ඉන්බමේ සූල්ග, එල්ලෝරුම් වාල්ග
(3) ආලයම් තොලුවදු සාලවුම් නන්ඩෘ (4) තිණ්ණිය නෙන්ජම් වේණ්ඩුම්

31. ගොවියා තම රැකියාව ආරම්භ කරන අවස්ථාවේ මුලින් ම කරන ක්‍රියාව,
(1) ඒර්මංගල සඩංගු ය. (2) මුලයිප්පු සඩංගු ය. (3) පොලි සඩංගු ය. (4) ආයුධ පූජාව ය.

32. පෙරියපුරාණම් ග්‍රන්ථයට මුල් ග්‍රන්ථය සහ උපකාරක ග්‍රන්ථය ලෙස සලකනු ලබන්නේ,
(1) තිරුප්පාවයි සහ තිරුවෙම්බාවයි ය.
(2) තිරුවිසයිප්පා සහ තිරුප්පල්ලාන්ඩු ය.
(3) තිරුත්තොණ්ඩත් තොගයි සහ තිරුත්තොණ්ඩර් තිරුවන්දාදි ය.
(4) තිරුවාසගම් සහ තිරුක්කෝවයාර් ය.

33. සුන්දරමූර්ති නායනාර් තුමන්ගේ දෙමව්පියන් වූයේ,
(1) සම්බුපාදාසිරියාර් සහ සිවඥානවදියාර් ය. (2) පුගලනාර් සහ මාදිනියාර් ය.
(3) සඩයනාර් සහ ඉසයිඥානියාර් ය. (4) සිවපාදවිරුදයර් සහ භගවදියාර් ය.

34. තිරුවාරූර්හි වැව් සකස් කර පිරිසිදු ජලය ලබා ගැනීමට සැලැස්වූයේ,
(1) මුරුග නායනාර් ය. (2) තණ්ඩියඩිගල් ය. (3) සිරුත්තොණ්ඩර් ය. (4) අප්පූදියඩිගල් ය.

35. ඉර පායා නාලිගයි හතහමාරක කාලයක් ඇතුළත සිදු කරන පූජාව කුමක් ද?
(1) උච්චිකාල පූජාව. (2) කාලයිචන්දි පූජාව. (3) සායරට්සයි පූජාව. (4) උෂක්කාල පූජාව.

36. තිරුඥානසම්බන්ද මූර්ත්ති නායනාර් තුමා පූම්භාවයිට පණ ලබාදීම සඳහා ගායනා කළ තේවාරම් වන්නේ,
(1) සඩයායෙනුමාල්... ය. (2) මට්ටිට්ට පුන්නයි... ය.
(3) සොට්රුනයි වේදියන්... ය. (4) තුනිවලර් තිංගල්... ය.

37. මාදර් මඩප්පිඩියුම්... තේවාරම් හි තාලය වන්නේ,
(1) තක්කේසි ය. (2) යාල්මුරි ය. (3) නට්ටපාඩයි ය. (4) කාන්දාර පංජමම් ය.

38. මානික්කවාසගර්තුමන් විමුක්තිය ලැබුවේ,
(1) ආනිමගම් දිනයේ දී ය. (2) සිත්තිරයි සදයම් දිනයේ දී ය.
(3) ආඩිචොදි දිනයේ දී ය. (4) වයිගාසි මූලම් දිනයේ දී ය.

● පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

| සන්දානකුරවර් | ඉපදුනු ස්ථානය | ග්‍රන්ථ |
|---|---|---|
| A. මෙයිකණ්ඩදේවර් | D. තිරුපෙණ්ණාගඩම් | G. සිවඥානසිත්තියාර් |
| B. අරුණන්දි සිවාචාරියාර් | E. කොට්ට්‍රවන්කුඩි | H. සිවඥානපෝදම් |
| C. උමාපති සිවාචාරියාර් | F. තිරුත්තුරයූර් | I. කොඩිකවි |

39. පුරච්චන්දාන කුරවර්ලාගෙන් පළමුවැන්නා හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, D හා H ය. (2) A, E හා I ය.
(3) B, F හා G ය. (4) C, D හා H ය.

40. සිදම්බරම් දේවාලයට අදාළ සන්ධාන කුරවර් හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, D හා H ය. (2) B, D හා G ය.
(3) B, F හා H ය. (4) C, E හා I ය.

**

[හතරවන පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | |
|---|---|
| **ශෛවනෙරි** | **I, II** |
| சைவநெறி | I, II |
| Saivaneri | I, II |

## ශෛවනෙරි II

- * **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- * පළමුවන ප්‍රශ්නයට ලකුණු **20**ක් ද, දෙවන ප්‍රශ්නයට ලකුණු **16**ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු **8** බැගින් ද හිමිවේ.

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
   (i) නිවසේ දෛනිකව සිදුවන ආගමික කටයුතු **දෙකක්** සඳහන් කරන්න.
   (ii) මානසික ගති ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
   (iii) සන්දාන කුරවර්ලා **හතරදෙනකු** නම් කරන්න.
   (iv) ආගමික කටයුත්තක දී කරනු ලබන පූර්ව ක්‍රියා **දෙකක්** ලියන්න.
   (v) "තන්නිලයිමයි මන්නුයිර්ගල් සාරත් තරුම් ශක්ති
   පින්නම්ලාන් එන්ගල් පිරාන්." – තිරුවාරුට්පයන් –
   මෙහි 'ශක්ති පින්නම්ලාන්' යනුවෙන් සඳහන් වන කොටසේ තේරුම කුමක් ද?
   (vi) ආණවම් මලම් සඳහා යෙදෙන වෙනත් නම් **දෙකක්** ලියන්න.
   (vii) "ඒඩවිල් අලංගල් මාර්බාන්..." යන ගීතිකාවෙන් ප්‍රශංසා ලබන දෙවියන් කවුද?
   (viii) කුමරගුරුබරර් විසින් රචනා කරන ලද ග්‍රන්ථ **දෙකක්** ලියන්න.
   (ix) ග්‍රාමීය වන්දනා ක්‍රමයේ පත්තිනි වන්දනාවේ ලක්ෂණ **දෙකක්** ලියන්න.
   (x) අභිරාමිබට්ටර්ගේ මුල් කාලයේ නම කුමක් ද? ඔහු රචනා කළ ග්‍රන්ථයක් සඳහන් කරන්න.

2. (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදි ව හා නියම අනුපිළිවෙළට ලියන්න.
   (ii) ඒවායේ තේරුම් ලියන්න.
   (අ) "තිරුවේයෙත් සෙල්වමේ..." (ආ) "ඉඩරිනුම් තලරිනුම්..." (ඉ) "මූවරෙන ඉරුවරෙන..."
   (ඊ) "කෝල මාල්වරයි..." (උ) "තන්දදුන් රන්නයික්..."

3. "ශෛව උපවාස මගින් ආධ්‍යාත්මිකව පමණක් නොව, විද්‍යාත්මක ප්‍රයෝජන ද අත්වේ."
   (i) උපවාස පිළිබඳ ව ආරුමුගනාවලර් පෙරුමාන්තුමා ලියා ඇති ප්‍රකාශය සඳහන් කරන්න.
   (ii) ශෛව උපවාස පිළිබඳ විද්‍යාත්මක හේතු **දෙකක්** සඳහන් කරන්න.
   (iii) ශෛව උපවාසවල ආධ්‍යාත්මික ප්‍රයෝජන **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

4. "මාගේ වගකීම අන් අයට සේවය කිරීමයි." – තිරුනාවුක්කරසර් –
   (i) තිරුනාවුක්කරසු නායනාර්තුමන් 'උලවාරප් පඩයියාලි' යනුවෙන් හැඳින්වීමට හේතුව කුමක් ද?
   (ii) තිරුනාවුක්කරසු නායනාර්තුමන්ගේ සමාජීය සේවා **හතරක්** සඳහන් කරන්න.
   (iii) තිරුනාවුක්කරසු නායනාර්තුමන් කළ සමාජ සේවා දැනගැනීමෙන් ඇති වන ප්‍රයෝජන **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

5. "අරුවුම් උරුවුම් අරිඥර්ක් කරිවාම්
   උරුවුම් උඩයාන් උලන්." – තිරුවරුට්පයන් –
   (i) දෙවියන්ගේ අරූප ස්වභාවය (අරුවත් තිරුමේනි) මොනවා ද?
   (ii) දෙවියන්ගේ අරූප රූප ස්වභාවය (අරුවුරුවත් තිරුමේනි) ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?
   (iii) දෙවියන්ගේ රූප ස්වභාවය (උරුවත් තිරුමේනි) ගැන කෙටියෙන් පැහැදිලි කරන්න.

6. "ඓතිහාසික වැදගත්කමකින් යුතු ශිව දේවාල කිහිපයක් ශ්‍රී ලංකාවේ පිහිටා ඇත."
   (i) පාලාවි තීර්ත්තම්වල විශේෂත්වය ගැන සුන්දරමූර්ති නායනාර්තුමන් සඳහන් කළ තේවාරම්වල පේළි **තුනක්** ලියන්න.
   (ii) තිරුකේදීශ්වරම් දේවාලයේ දෙවියන්ගේ (මූර්ති) විශේෂතා සහ එම දේවාලය ගැන තේවාරම් ගායනා කළ **දෙ-දෙනකුගේ** නම් සඳහන් කරන්න.
   (iii) පොන්නම්බලවානේෂ්වරම් දේවාලය පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

7. පහත සඳහන් ඒවායින් **දෙකකට** කෙටි සටහන් ලියන්න.
   (i) කේදාරගෞරි උපවාසය (ii) ශෛව ආගමික ජීවිතය
   (iii) ශෛව නාට්පාදම් (iv) කඩයිට් සුවාමිහල්
   (v) නාගදීපයේ නාගපූෂණි අම්මන් දේවාලය

***